# දුරසිට ඉගැන්වීමේ ක්‍රමය මගින් ගොවීන් හමුවීම පිළිබඳ 'අත්දැකීමක්

බොහෝ දියුණු රටවල් වල දුර සිට තැපැල් මගින් වැඩිදුර ඉගැන්වීම ප්‍රචලිත ක්‍රමයකි. ඒ ඒ අවස්ථාවන් සඳහා විෂයයන්ට හා අවස්ථාවන්ට උචිත වන පරිදි මෙම ක්‍රමය ඒ ඒ රටවල නවීකරණය කර ඇත. මෙම මතය අනුව පුහුණුවීමේ හා හමුවීමේ ක්‍රමය මගින් මුණ නොගැසෙන ගොවීන් සඳහා (ගොවිපලේ ජීවත් නොවන) කරන ලද ව්‍යාපෘතියක් පිළිබඳ අත් දැකීම් දරි ගන්වන සුළුය.

## ක්‍රමය:

යාපනය දිස්ත්‍රික්කයේ ඉරනමඩු ව්‍යාපාරයේ අක්කර 12000 කින් සමන්විත ජල සම්පාදනය කළ හැකි වී වගා කරනු ලබන විශාල ප්‍රදේශයකි. මෙහි දෙයාකාරයකින් යුත් ගොවීන් හා ගොවි බිම් ඇත.

(අ). මෙම ව්‍යාපාරයේ ජල සම්පාදනය කළ හැකි කුඹුරු ඉඩම් 50% පමණ අයිතිව ඇත්තේ 500 පමණ වූ මධ්‍යම පංතියේ අයටය. අක්: 10 – 20 පමණ වූ ගොවි බිම් වල පදිංචිව ඇත්තේ රැකවල් කරුවන්ය. අයිතිකරුවන් පදිංචිව ඇත්තේ ඈත ටවුම් බද ප්‍රදේශවලය. මෙම රැකවල් කරුවන් තීරණ ගන්නවුන් නොවේ. ඔවුන් ක්‍රියා කරනු ලබන්නේ සති අන්තයේ ගොවිපල් වලට පැමිණෙන අයිතිකරුවන් දෙනු ලබන උපදෙස් අනුවය. අනික් අවස්ථාවලදී නිශ්චය උපදෙසක් නොමැතිව ගොවිපලේ වැඩ කරයි. මෙම ගොවිපල් අයිතිකරුවන් වෙළඳ ව්‍යාපාරිකයන් රජයේ සේවකයින්

නීතිඥයන් දොස්තරවරුන් ආදී පුද්ගලයන්ය. මෙම අයට නව වී වගාවන් දියුණුකර ගැනීමට තාක්ෂණික උපදෙස් ඉතා අගනේය.

(ආ). ඉතිරි ඉඩම් 50% ද පදිංචිව සිටින්නේ 2000 ක් පමණ ජනපදිකයින්ය. ඔවුන්ට කුඹුරු අක්කර 3 – 5 පමණ ඉඩම් ඇති අතර, පදිංචිව සිටින්නේ එම ගොවි බිමෙහිමය. ඔවුන් තමන්ගේ ගොවිපල පාලනය කරන අතර, තීරණ ගන්නේ තමන් විසින්මය.

පළමු සඳහන් කල ගොවිපලවල් වල පදිංචි නැති ගොවි මහතුන් හමුවීම සඳහා මෙම දුරසිට ඉගැන්වීමේ ක්‍රමය උපයෝගී කරගන්නා ලදි. සසඳා බැලීම සඳහා 40% ක් පමණ දෙවන කණ්ඩායමින් (ගොවිපලේ පදිංචි ගොවීන්) ගොවීන් තෝරා ගන්නා ලදි. මෙම ක්‍රමය පිළිබඳ එවැනි නිළධාරීන්ට අවබෝධකර දීමෙන් පසු පුහුණුවීමේ සහ හමුවීමේ වැඩ සටහනට ඇතුලත් නොවන ගෘහ සඳහන් පළමු කණ්ඩායමෙන් 60 දෙනෙකුගේ සහ දෙවන කණ්ඩායමෙන් 40 දෙනෙකුගේ ලිපිනයන් ලබාගන්නා ලද්දේ කෘෂි.නි. (කලාපීය) කෘෂිකර්ම උපදේශක වරුන් දෙදෙනෙක් හා කෘෂි සේවා මධ්‍යස්ථානයේ උපකාරීත්වයෙන්ය.

මෙම තෝරාගත් පිරිසට පාඩම් මාලා 8 ක් සකස්කර සති දෙකකට වරක් බැගින් 1982 ඔක්තෝබර් සිට 1983 ජනවාරි දක්වා තැපැල් මගින් යවන ලදි. එක් එක් පාඩම් මාලාවේ අඩංගු වූයේ ඉදිරි දෙසතිය තුල කල යුතු පාලනමය කෘෂිකාර්මික කටයුතුය. ඒවාට රූපසටහන්, පිංතූර, නිරීක්ෂණය කල යුතු දෑ පිළිබඳ විස්තර ආදිය සවිස්තරව අඩංගුකර තිබුනි. පාඩම මාලා සකස්කල කෘෂිවැඩ වරින්

වර ක්ෂෙත්‍රයට ගොස් ක්ෂෙත්‍ර කටයුතු කම් උවදුරු, රෝග වශාවේ තත්ත්වය ආදිය පිළිබඳව සොයා බලන ලද්දේ ක්ෂෙත්‍ර තත්ත්වයන්ට අදාළ අන්දමින් ඉදිරි පාඩම් මාලා සකස් කිරීමටය.

දුර සිට ඉගෙනගන්නා දෙදෙනෙකුගේ ඇරයුම පරිදි දෙවරක් ක්ෂෙත්‍රය පරීක්ෂා කිරීමට යන ලදි. ඒ ඔවුන් විසින් දන්වා එවූ විශේෂ ප්‍රශ්න පිළිබඳ සොයා බැලීමටය. (පාඩම් පත්‍රයේ පිටපතක් ඇමුණුම් 1 දක්වා ඇත.)

ප්‍රථමයෙන්ම පාඩම් මාලා 100 ක් තැපැල් කරන ලදුව එයින් සියයට 30 ක් පමණ ආපසු ලැබුණේ ඒවා ගොවීන් අතට පත් නොවූ නිසාය. මෙම ලිපි ව්‍යාප්ති නිළධාරීන් අතට දී ඔවුන් මගින් බෙදා හරින ලදි. මෙම ලිපි වලින් 19 ක් භාරදීමට නොහැකි විය. අන්තිමේ දක්වාම ඉතිරි 81 දෙනාට මෙම පාඩම් මාලා යවන ලදි.

මෙම දුර සිට ඉගෙන ගන්නා අයගේ රැස්වීමක් 1983 ජනවාරි මුල් භාගයේදී කැඳවනු ලැබුවේ ඔවුන් ඒ සඳහා දක්වන ප්‍රති ක්‍රියා පිළිබඳව සොයා බැලීමටය. පළාතේ හැටියට සාර්ථක සහභාගිත්වයක් තිබුණි. වෛද්‍යවරු වෙළඳ ව්‍යාපාරිකයන් ආදීන් ගෙන් සමන්විත 33 දෙනෙක් පමණ සහභාගී විය. එදින මෙම ගොවි මහතුන්ට කලාපීය පර්යේෂණ ස්ථානයේ සහ සේවා සංස්කරණ ආයතනයේ ක්ෂෙත්‍ර චාරිකා සැළසුම් කර කරුණු උගන්වන ලදි.

නිරීක්‍ෂණ:-

(1). මෙම පාඩම් මාලා ගොවි මහතුන් අතර, ජනප්‍රිය වී තිබුනි. බොහෝ දෙනෙක් මෙම පාඩම් මාලා ෆෝල්ඩරිවල දමාගෙන ගොනුකර තිබුණ අතර, වරින් වර ඒවා පෙරලා බලනු දිස්විය. මෙම පාඩම් මාලා ලැබෙන සුළු ගොවීන් පිළිබඳව අසල් වැසි ගොවීන් දැන සිටියහ. අසල් වැසියන්ටද මෙම පාඩම් කියවන්ට දී ඇත.

(2). තව සමහර අය තමන්ගේ අසල් වැසියන්ට මෙම පාඩම් මාලා ලැබෙන බව දැනගෙන ඒවා තමන්ටත් එවන ලෙස සේවා සංස්කරණ ආයතනයට ලිපි මගින් දන්වා එවා ඇත.

(3). පාඩම් මාලා වල ඇතුලත් නොවූ සමහර ප්‍රශ්න ගැන ලියා උපදෙස් ඉල්ලීමෙන් පෙනී ගියේ ඔවුන්ගේ සහභාගිත්වය සහ ප්‍රතිචාරයන් වැඩි බවය. (උදා: මී සාතිය පිළිබඳව) මේ නිසා පාඩම් කතකැනට තම පාඩම් මාලාව ක්‍ෂෙත්‍ර ප්‍රශ්න සඳුනාගෙන අදාළ අන්දමින් සකස් කිරීමට බෙහෙවින් උපකාරී විය. එමගින් අනිකුත් ගොවි මහතුන්ටද ප්‍රයෝජනවත් වන පරිදි පාඩමාලා සකස් කෙරුණි.

(4). මෙම පාඩම් මාලා ලැබුණ ගොවි මහතුන් අතර, උද්‍යෝගය වැඩිවිය. ඔවුන් ඉතා වටිනා ව්‍යාපෘතියකට සහභාගී වන්නන් බවත්, එමගින් කිසි කරදරයක් නොමැතිව තමුන්ට අවශ්‍ය වටිනා උපදෙස් ලැබෙන බවත් ඒත්තු ගැන්වී තිබුනි.

(5). මෙම රැස්වීමට සහභාගී වූ සියල්ලන්ගේම ඉල්ලීම වූයේ තවත් කන්නයක් (යල) පසුවන තෙක් ඔවුන්ට වී වගා පිළිබඳ පාඩම් මාලා ලැබෙන්ට සලස්වන ලෙසටය.

(6). ජනපදිකයන් වූ අනිකුත් ගොවි කණ්ඩායම තම බිසව්වල අනිකුත් ආහාර බෝග වන මිරිස්, රතුළූණු ආදිය වැවීම සඳහා අවශ්‍ය පාඩම් මාලාද ඇතුලත් කරන ලෙස ඉල්ලන ලදි.

## සැළකිය යුතු කරුණු කිපයක්

(1). විශේෂයෙන්ම දුර පළාත් වලට පාඩම් මාලා තැපැල් මගින් ලබාදීම සඳහා තැපැල් දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ සහය පළමුවෙන්ම ලබා ගත යුතුය.

(2). පාඩමාලා සපයන ක්ෂේත්‍ර ස්ථානයේ සිට සැතපුම් 5 පමණ දුර ප්‍රමාණය සීමාකළ යුතුය. ඒ ක්ෂේත්‍රයේ පරීක්ෂාවන් කර අදාළ අන්දමින් පාඩමාලා සකස්කර ගැනීමට ලෙහෙසි වන නිසාය.

(3). පාඩම් ලැබෙන අය වැඩියෙන්ම කැමති වූයේ දිග හැලි සහිත විස්තර ඇති පාඩම් පත්‍ර වලට නොව රූප සටහන් ආදිය සහිත පාඩම් පත්‍ර වලටය.

(4). පාඩම් කතෘගේ ආපසු ලිපිනය සහිත සීල් (රජයේ) තැබූ කවරයක් යැවීමෙන් පාඩම් ලැබෙන්නාට වියදමක් නොමැතිව ආපසු අවශ්‍ය කරුණු පිළිබඳව කතෘගෙන් විමසීම් කිරීමට හැකිවිය.

(5). එක් පාඩමක් (පත්‍ර 1 – 2 පමණ) සැපයීමට ශත 25 කට වඩා අඩු මුදලක් වැයවේ. එහෙත් ගොවිපල මෙහෙය වන්නාට සාර්ථක ලෙසත් ප්‍රිය 'ජනක ලෙසත් අවශ්‍ය වටිනා උපදෙස් එමගින් ලැබේ.

අර්ධ කාලීන හා ගොවිපල්වල වාසය නොකරන ගොවීන් ඇති නගර බද ජනතාවට උපදෙස් සැපයීම සඳහා මෙම ක්‍රමය අත්හදා බැලිම වටී.

(මෙම ව්‍යාපෘතිය කිරීමේදී නි.අ. (අධ්‍යාපන හා පුහුණු) ඇස්. නවේසන් මහතාගෙන් ලැබුන උපදෙස් හා මග පෙන්වීම අගේකොට සලකමි. තවද විග්නේස්වරම් (යතුරු ලේඛක) තිරුමේල්වම් (චිත්‍ර අඳින්නා) පෙරිම්පරාජ් (කැමරාකරු) හා නිෂ්පාදනය හා තැපැල් කිරීමට සහය වූ දේවේන්ද්‍ර සහ විජය කුමාරි යන අයටද භාග්‍යාගි වී, පිළිතුරු සැපයූ ගොවි මහතුන්ටද මගේ හෘදයාංගම ස්තුතිය පිරිනැමේ. වැරදි හා ප්‍රමාද දෝෂ සියල්ල කේ. වරිදරාසා යන මට භාරයි).

ඇමුණුම් (1).

සේ.සං.අ. ආයතනය,
කිලිනොච්චිය.

හිතවත් මහත්මයාණෙනි,

අපගේ පසුගිය පාඩමෙන් අපි විස්තර කල

(අ).
(ආ).
(ඇ).

කරුණු ඔබට ප්‍රයෝජනවත් වී යයි සිතමු. මෙම පාඩමෙන් ඔබට දක්වන්නේ මී ලඟ දෙසතිය තුල කල යුතු වැඩ පිළිබඳව උපදෙස්ය. ඔබට වැඩිදුර තවත් උපදෙස් අවශ්‍ය නම් මෙහි අමුණා ඇති පත්‍රිකාව පුරවා (තැපැල් ගාස්තු අවශ්‍ය නැත) අප වෙත එවන්න.

## 1. ක්‍රියාවලිය:

1. ඒක. මතුපිට යෙදීම.

(අ). මාස 4 – 4 1/2 වී වගී වලට...... යොදන්න. ........... වැනි පැරණි වගී වලට.


(ආ). මාස 4 – 4 1/2 නව දියුණු වගී වලට ............. යොදන්න.......... වැනි නව දියුණු වගී.

(ඇ). මාස 3 1/2 නව දියුණු වගී වලට...... යොදන්න. ........... වැනි නව දියුණු වගී.

ජාත්‍යන්තර සහල් පර්යේෂණායතනයේ පොතකින් පිංතූරයක්

## (2). ජල පාලනය:

ගැඹුරට ජලය බැඳ තැබූ විට පුළිලව කඳ දික්වීම. විවෘත වූ පසේ වැඩියෙන් වල්පැල පැලවීම (තණ) ඉතා හොඳ අඟල් 2 ක් පමණ ජලය බැඳ තැබීමය.



ජා.ස.පර්. පොතකින් පිංතූරයක්

## (3). කෘමි උවදුරු ඇතිවීම:

කෘමි උවදුරු සඳහා සොයා බලන්න. (අ) පුරුක් පණුවන් (ආ) කොළ හකුළන දළඹුවන් (වැඩුණු සලබයින් හා බිත්තර කැදලි බලන්න)

සොයා බැලිය යුතු තැන් හා
විස්තර

සොයා බැලිය යුතු තැන් පිළිබඳ
විස්තර

පිංතූර ඒ

පිංතූර බී